රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:21/90

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1990.මාර්තු මස 30 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

**සාම පාපැදි තරගය - 1990.**

1990 සිංහල, හින්දු අලුත් අවුරුදු උත්සවය නිමිති කරගෙන 1990.04.14 දින කොළඹ, ගාලු මුවදොර පිටියෙන් ආරම්භ කර, සැතපුම් 914 ක පමණ දුරක් ගමන් කොට 1990.04.29 දින ආපසු කොළඹට පැමිණීමේ සාම පාපැදි තරගයක්, ගරු කෘෂිකර්ම රාජ්‍ය ඇමතිතුමා විසින් සංවිධානය කර ඇත. මෙම තරගයට ඔබ යටතේ ඇති ආයතනයන්ගෙන් හැකි තරම් නිලධාරීන්/ සේවකයින් සංඛ්‍යාවක් සහභාගී කරවා ගැනීමට ක්‍රියා කරන මෙන් කරුණාවෙන් දන්වමි.

02 මෙම සාම පාපැදි තරගය සඳහා සහභාගී වන ස්ථිර හෝ ස්ථිර නොවන සියළුම රාජ්‍ය/සංස්ථා නිලධාරීන්ට/ සේවකයන්ට ඒ සඳහා ගතවන දින 16 ක කාලය සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු අනුමත කළ හැකිය. කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයෙන් ඒ ඒ තරගකරුවන්ට නිකුත් කරන ලිපි අනුව ආයතන ප්‍රධානීන් විසින් නිවාඩු අනුමත කළ යුතුය.

03 සාම පාපැදි තරගය සම්බන්ධව සම්පූර්ණ විස්තර ජන මාධ්‍යය මගින් පළකරනු ලැබේ.

අ.කලේ/(පී.එන්.එම්. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.